# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය - 2018/2019

## සංගීත පීඨය

## තබ්ලා ඉතිහාසය

## MUNI 31012

කාලය :- පැ 02

සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතරකින් (04) සමන්විත වේ.
- ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ලැබේ.

---

1. තබ්ලා නැමැති අවනද්ධ භාණ්ඩය භාරතය තුළ උත්පාදනය වීමට හේතු කාරක වුණු සාමාජීය කරුණු විමසමින් භාරතය තුළ තබ්ලාවේ ක්‍රමික විකාශය විස්තර කරන්න.

2. උස්තාද් අහමද් ජාන් තිරක්වා, උස්තාද් අල්ලාරඛා සහ පණ්ඩිත් ශාම්තා ප්‍රසාද් මිශ්‍ර යන භාරතීය අද්විතීය තබ්ලා වාදන ශිල්පීන් ගේ වාදන කෞෂල්‍යය හා වාදන විශේෂතා පිළිබඳ විචාරයක යෙදෙන්න (මේ සඳහා LMS හි සපයා ඇති වීඩියෝ පරිශීලනය කළ හැකි ය).

3 තබ්ලාවේ කඳ, මුහුණත් ආවරණය පිණිස යොදාගන්නා සම හා ස්‍යාහි යන කොටස් එයින් උත්පාදනය වන්නා වූ ධ්වනිය කෙරෙහි බලපාන ආකාරය විස්තර කොට ඉන් එක් කොටසක් තෝරාගෙන උසස් ධ්වනියක් උත්පාදනය කිරීමෙහි ලා එය කිනම් ප්‍රමිතිගත තත්ත්වයකින් යුක්ත වියයුතු දැ යි ඔබ ගේ යෝජනා ද සහිත ව පහදන්න.

4 “වර්තමාන තබ්ලා ශාස්ත්‍රය හා ශිල්පය ප්‍රධාන ඝරාණා හයක දායකත්වයෙන් හා පෝෂණයෙන් පරිපූර්ණත්වයට පත් වී ඇත”.

ඉහත ප්‍රකාශය අවධාරණය කරමින් තබ්ලා ඝරාණා සහ භාජ් පිළිබඳ විස්තරයක යෙදෙන්න

:::::::::::::::::::::::::::::::::: 2021.11.03